# නිපුණතා මට්ටම 4.2


**සරල ගණිත ගැටළු විසඳීම සඳහා පැතුරුම්පත් මෘදුකාංග භාවිත කිරීම**

- ගණිතමය මෙහෙයුම් ඉටුකිරීම සඳහා යොදාගනු ලබන අන්තර් ක්‍රියාකාරී ඉලෙක්ට්‍රොනික පරිගණක යෙදුමක් **පැතුරුම්පතක්** ලෙස හැඳින්වේ.
- එමෙන්ම එය සංඛ්‍යාත්මක දත්ත ගබඩා කිරීම, සංවිධානය කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රස්ථාරික නිරූපණය සඳහා ද යොදාගත හැකිය.

**පැතුරුම්පත් මෘදුකාංග සඳහා උදාහරණ:**

| මෘදුකාංගය | නිෂ්පාදන ආයතනය |
|---|---|
| OpenOffice – Calc (Free - නිදහස්)<br>LibreOffice – Calc (Free - නිදහස්) | The Document Foundation (Open Source-විවෘත කේත) |
| Microsoft Office - Excel | Microsoft Corporation |
| Numbers (Apple iWork suite) | Apple Corporation |
| Google Sheets | Online and free |

**අතුරුමුහුණත හා එහි සංරචක**



**වැඩ පොත හා වැඩපත**

පැතිරුම්පතේ ගොනුවක් **වැඩ පොතක්** ලෙස ද, වැඩ පොතේ එක් පිටුවක් **වැඩපතක්** ලෙස ද හැඳින්වේ.

**පේළි (row) සහ තීරු (column)**


වැඩපතේ සිරස් අතට පිහිටි කොටු එකතුවක් **තීරුවක් (column)** නම් වේ.

පළමු තීරුව ඉංග්‍රීසි හෝඩියේ මුල් අකුරින් ආරම්භ වී අවසානය තෙක් ඉදිරියට නම් කරයි. (උදා - A, B, C, ........, AA ,AB , .... , AZ, BA, ..., XFD)

වැඩපතේ තිරස් අතට පිහිටි කොටු එකතුවක් **පේළියක් (row)** නම් වේ.

පළමු **පේළිය** 1න් ආරම්භ වී අවසානය තෙක් ව්‍යාප්තව පවතී. (උදා - 1,2, .........65536, ......,1048576)

**සක්‍රිය කෝෂය, කෝෂ ලිපින**




**කෝෂයක ඇතුලත් කළ හැකි දත්ත ප්‍රරූප**

- පාඨ - සංඛ්‍යා නොවන අක්ෂර, වෙනත් අනුලක්ෂණ
- සංඛ්‍යා - ගණනය කිරීම් සඳහා අවශ්‍ය වන සංඛ්‍යා
- සමීකරණ - සෑම විටම සමාන ( ‘ = ’ ) ලකුණින් ආරම්භ කළ යුතුය.

**අවශ්‍ය පරිදි කොටුවකට අදාල ආකෘතිකරණ යෙදීම.**

**කොටු ආකෘතිකරණය -** කොටුවක පෙනුම, අඩංගු දෑ වෙනස් කිරීම.

අක්ෂර - අක්ෂර මුහුණත(වර්ගය), ප්‍රමාණය, පැහැය, තද අකුරු, ඇල අකුරු, යටින් ඉරි ඇඳීම

එකෙල්ල කිරීම - සිරස්, තිරස්, දිශානතිය

පෙළ එතුම(Text Wrapping) - කොටු එකතු කිරීම සහ මධ්‍යයට ගෙන ඒම

ඉලක්කම් ආකෘතිකරණය - මුදල්, ප්‍රතිශත, දිනය හා වෙලාව, විද්‍යාත්මක ආකෘතිය, දශමස්ථාන අඩු/ වැඩි කිරීම

**වැඩපතකට අවශ්‍ය පරිදි පේලි සහ තීරු ඇතුළත් කිරීම.**

**වැඩපතක ඇති අනවශ්‍ය පේලි සහ තීරු ඉවත් කිරීම.**

**අවශ්‍ය පරිදි වැඩපත් ඇතුළත් කිරීම, මකා දැමීම, නැවත නම් කිරීම.**

**කෝෂ පරාසයක් තෝරා නම් කිරීම.**

එක වර තෝරා ඇති කොටු කිහිපයක් කෝෂ පරාසයක් ලෙස හැඳින්වේ.

**කෝෂයක අඩංගු දේ කොපි කිරීම හා විතැන් කිරීම.**



Anoma Dolewatta (☎ 0719422230) ITDLH – Mawanella

**ගණිත කර්ම**

| | Calculation | Example |
|---|---|---|
| එකතුව | Addition | =B2+D2 |
| අන්තරය | Subtraction | =C3-B3 |
| ගුණිතය | Multiplication | =D9*D10 |
| ලබ්ධිය | Division | =G9/G10 |
| බලය | Exponent<br>Raise to a power | =D14^2 |

ශ්‍රිත - කලින් නිර්මාණය කොට ඇති සමීකරණ

= Function_name (parameters)

**<u>ශ්‍රිත</u>**

= Sum - එකතුව = Average - සාමාන්‍ය

= Max - උපරිම අගය = Count - අගයන් ඇතුළත් කෝෂ ගණන

= Min - අවම අගය

- ශ්‍රිතය භාවිතයෙන් =Sum (B1|:B5)
- සමීකරණ භාවිතයෙන් = (B1+ B2+ B3+ B1+ B5)

=Rank(number, ref, order) පරාසය තුළ අගය අනුව ස්ථානය

number- අගය සහිත කෝෂයේ යොමුව

ref - සෙවිය යුතු පරාසය

order - 0 හෝ හිස් ආරෝහණ, වෙනත් අගයක් අවරෝහණ

**<u>සාපේක්ෂ හා නිරපේක්ෂ කෝෂ යොමුව</u>**

H2 - සාපේක්ෂ කෝෂ යොමුව

H$2 - පේළි නිරපේක්ෂ කෝෂ යොමුව



$H2 - තීරු නිරපේක්ෂ කෝෂ යොමුව

$H$2 - පේළි හා තීරු නිරපේක්ෂ කෝෂ යොමුව

**<u>මෙහෙයවන පූර්විකතා අනුපිළිවෙළ</u>**

( ) ^ * / + -

**ප්‍රස්තාර**

| ප්‍රස්තාර වර්ගය | මූලික පිරිසැලැස්ම | භාවිතය |
|---|---|---|
| තීරු ප්‍රස්තාර (Column Chart) |  | දත්ත අයිතම ශ්‍රේණි සමූහයක් එකවර සැසඳීම.<br>කාණ්ඩ වශයෙන් සැසඳීම. |
| දඬු ප්‍රස්තාර (Bar Chart) |  | දත්ත අයිතම ශ්‍රේණි සමූහයක් එකවර සැසඳීම.<br>කාණ්ඩ වශයෙන් සැසඳීම. |
| රේඛා ප්‍රස්තාර (Line Chart) |  | දත්ත අයිතම ශ්‍රේණි සමූහයක් එකවර සැසඳීම.<br>කාණ්ඩ වශයෙන් සැසඳීම. |
| වට ප්‍රස්තාර (Pie Chart) |  | දත්ත අයිතම ශ්‍රේණියක් ප්‍රතිශත අගය මගින් සැසඳීම. |



Anoma Dolewatta (☎ 0719422230) ITDLH – Mawanella

**පැතුරුම් පත් මෘදුකාංග හරහා දත්ත තේරීම සහ පෙරීම**

**දත්ත තේරීම**

පැතුරුම් පත් මෘදුකාංග හරහා අවශ්‍ය පරිදි දත්ත, පේලියක් හෝ පේලි කිහිපයක් හෝ අනුව, ආරෝහණ/ අවරෝහණ පරිපාටියට අනුව හෝ ඔබට අවශ්‍ය වෙනත් නිර්ණායක අනුව හෝ තෝරා ගැනීමේ පහසුකම ඇත.

**දත්ත පෙරීම**

පැතුරුම් පත් මෘදුකාංග හරහා දත්ත අවශ්‍ය පරිදි පෙරා ලබා ගත හැකි ය. දෙන ලද නිර්ණායකයනට අනුව අවශ්‍ය දත්ත උපකුලකයක් වෙන්කොට ලබා ගත හැකි ය.

**වැඩපතක් මුද්‍රණය කිරීම**

සම්පූර්ණ වැඩපත හෝ ඉන් අවශ්‍ය කොටසක් හෝ මුද්‍රණය කර ගැනීමේ පහසුකම පැතුරුම්පත් මෘදුකාංග තුළ දක්නට ඇත.මුද්‍රණයට පෙර පහත දැක්වෙන වෙනස්කම් සිදු කොට පැතුරුම් පත සකස්කොට ගත හැකි ය.

- පිටු විකල්ප(දිශානතිය, ප්‍රමාණය ඇදිය)
- පිටු දාර, සහ එකෙල්ල කිරීම ආදිය
- පැතුරුම් පත් විකල්ප(මුද්‍රණ පෙදෙස, කොටු රේඛා (grid lines), පුනර්කරණය විය යුතු පේලි/තීරු ආදිය

